## අනුකූලතාවය *(අනෙක් පුද්ගලයාගේ එකඟ වීම හෝ නොවීම පිළිගැනීම හා ඊට ගරු කිරීම)*

ඔහුගේ/ඇයගේ එකඟතාවකින් තොරව ඔහු/ඇය ස්පර්ශ කිරීමට, සිප ගැනීමට හෝ යම් ලිංගික ක්‍රියාකාරකමක යෙදීමට ඔබට අයිතියක් නැත. එපා කියන්නේ එපා කියන එකයි!! එකඟ නොවේ යැයි යමෙක් පවසන්නේනම් එහි අර්ථය එකඟ නොවීම ම බව ඔබ වටහා ගත යුතුය.

එකඟ නොවීම පිළිගැනීමට හා ඊට අනුකූල වීමට;

- යම් ලිංගික කටයුත්තක් සම්බන්ධයෙන් ඔබ කොතෙක් දුරට පැමිණ ඇත්ද යන්න වැදගත් නොවේ
- අනෙක් පුද්ගලයා මින් පෙර එකඟවී සිටිම ද ඊට වැදගත් නොවේ
- ඔබට තව දුරටත් එහි නියැළීමට අවශ්‍ය වුව ද එය වැදගත් නොවේ
- ඔහු/ඇය ඔබව ආකර්ෂණය වන අයුරින් ඇඳ පැළඳ සිටීම ද ඊට වැදගත් නොවේ

### ඔබ දන්නවාද?



ශ්‍රී ලංකාවේ නීතිය අනුව ගැහැණියක හා පිරිමියකු ලිංගික සංසර්ගයේ යෙදීමේ දී ඊට එකඟතාවය ලබා දිය හැක්කේ එම ගැහැණිය;

- මානසික වශයෙන් එම කාර්යය සඳහා යෝග්‍ය තත්ත්වයේ සිටීනම්
- වයස අවුරුදු 16 ඉක්මවා ඇත්නම්
- මද්‍යසාර හෝ එවැනි බලපෑමක් ඇති කරන මත්ද්‍රව්‍ය පරිහරණයකින් තොරව සිටීනම් හා
- මරණය, ශරීර හානි හා රඳවා තබා ගැනීම පිළිබඳ තර්ජන/බියවැද්දවීම් මගින් හෝ බලහත්කාරයෙන් පොලඹවා ගෙන නොසිටී නම් පමණි.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ සමලිංගිකත්වය අපරාධයක් වුව ද ඊට අදාළ වගන්ති බොහෝවිට බලාත්මක කර නොමැති අතර එමගින් සිවිල් හා දේශපාලන අයිතීන් සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතියට (ICCPR) අනුකූලව කටයුතු කෙරේ.

## ගරු කිරීම

ඔබගේ ලිංගික නැඹුරුව හා ඔබගේ ලිංගික රුචිකත්වයන් සම්බන්ධයෙන් සමාජයේ පිළිගැනීමක් හා ගරුත්වයක් ලබන්නට ඔබට අයිතියක් ඇත. ඔබගේ ලිංගික නැඹුරුව විරුද්ධ ලිංගික, සමලිංගික, අලිංගික (ලිංගික ආශාවන් නොමැති), ඕනෑම ලිංගික නැඹුරුවක් කෙරෙහි ආකර්ෂණය වන, සංක්‍රාන්ති ලිංගික, අන්තර් ලිංගික ආදී කුමක් වුව ද එය ඔබගේ අනන්‍යතාව පිළිබඳ එක් කොටසකි.

අප සැවොම එක හා සමාන නොවේ. එබැවින් සැමට ම ගරුත්වයෙන් යුතු ව සැළකීම ඔබගේ වගකීමයි.

## ආරක්ෂාව

ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීමට ඔබට අයිතියක් ඇත.
අනවශ්‍ය ගැබ් ගැනීම්වලින් ආරක්ෂා වීමට ඔබට අයිතියක් ඇත.
ඒඩ්ස් වැනි ලිංගික ව සම්ප්‍රේෂණය වන රෝග වැළදීමෙන් ආරක්ෂාවීමට ඔබට අයිතියක් ඇත.

### ලිංගික හිංසනය/අනර්ථය

ශාරීරික, වාචික, මානසික, ආර්ථික හා ලිංගික ස්වරූපයේ ප්‍රචණ්ඩත්වය හා අපයෝජන ද පුද්ගලයකුගේ ලිංගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාව, ලිංගික නැඹුරුව, විවාහක අවිවාහක බව, ලිංගිකත්වය පිළිබඳ අතීතය හෝ චර්යා (සත්‍ය හෝ උපකල්පිත) ලිංගික පිළිවෙත් හෝ ලිංගිකත්වය දක්වන ආකාරය හේතු කොට ගෙන යමෙකුට සිදුකරන ප්‍රචණ්ඩත්වය ද ලිංගික හිංසනයට අයත් වනවා.

ප්‍රචණ්ඩකාරී නොවීමත් අන් අය ප්‍රචණ්ඩත්වයට ගොදුරු නොකිරීමත් ඔබගේ වගකීමකි.
ඔබගේ ලිංගිකත්වය අනවශ්‍ය ගැබ් ගැනීම් හට ගැනීමට හේතු නොවන බවට සහතික වීමේ වගකීම ද ඔබ සතුය.
ඒඩ්ස් වැනි ලිංගික ව සම්ප්‍රේෂණය වන රෝග වැළදීමෙන් අන් අය ආරක්ෂා කිරීමේ වගකීමක් ද ඔබට ඇත.

### ලිංගික සූරාකෑමෙන් ආරක්ෂා වීම

නීතියට අනුව සියලු ම ළමුන් හා නව යොවුන් වියෙහි පසුවන්නන්ට ලිංගික සූරාකෑමෙන්, ප්‍රචණ්ඩත්වයෙන්, හිංසනයෙන්, ආරක්ෂා වීමට අයිතියක් ඇත. ළමුන් ගණිකාවන් ලෙස යොදා ගැනීම, සියලු ම ආකාරයේ ලිංගික අපයෝජන, ප්‍රචණ්ඩත්වය හා අතවර, ළමුන් බලහත්කාරයෙන් ලිංගික ක්‍රියාකාරකම් හා අසභ්‍ය දර්ශන සඳහා යොදා ගැනීම් ද මීට අයත් වේ. ව්‍යාභිචාරය (ලේ ඥාතීත්ව සබඳතාවය සහිත තැනැත්තෙකු සමග ලිංගික සංසර්ගය) ශ්‍රී ලංකා නීතිය යටතේ අපරාධයකි.


**තොරතුරු සඳහා දායකත්වය:** එක්සත් ජාතීන්ගේ ලෝක සෞඛ්‍ය සංවිධානය, ඉන්ටර්නැෂනල් ප්ලෑන්ඩ් පෙයරන්ට්හුඩ් ෆෙඩරේෂන් සහ මිනෙසෝටා විශ්වවිද්‍යාලයේ ට්‍රාන්ස් අවෙයානස් ව්‍යාපෘතිය සතු තොරතුරු

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය අධ්‍යයන කේන්ද්‍රය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**දුරකථන:** 0112908939
**ඊ මේල්: cgsuk@kln.ac.lk**
**වෙබ් අඩවිය: http://www.kln.ac.lk/units/cgs/**

CENTRE FOR GENDER STUDIES
UNIVERSITY OF KELANIYA

*පිටු සැකසුම: තිළිණි මීගස්වත්ත*
*පරිවර්තනය: මනෝජා ලියනආරච්චි*

# ලිංගික අයිතිවාසිකම් හා වගකීම්



# පූර්විකාව

යමෙකුගේ ලිංගිකත්වය, ඔහු හෝ ඇය මනුෂ්‍යයෙකු වීමේ එක් අංගයක්. එමෙන්ම තම වර්ගයා බිහි කිරීමේ අදහස ඇති ව හෝ නැති ව ලිංගික සබඳතා හා ක්‍රියාකාරකම් මගින් වින්දනයක් ලැබීමත් ඊට ම අයත් අංගයක්.

මේ අනුව ලිංගිකත්වය ප්‍රජනනය සඳහා ම පමණක් පවතින්නක් නොවෙයි. ප්‍රජනනයට පරිබාහිර ව සිය ලිංගික තෘප්තිය අත්විඳීමටත් ඉන් වින්දනයක් ලැබීමටත් ඕනෑම පුද්ගලයකු හට පූර්ණ අයිතියක් පවතිනවා. එමෙන්ම ප්‍රජනනය සඳහා පමණක් ලිංගික සංසර්ගයේ යෙදීමත් ඔහුගේ හෝ ඇයගේ අයිතියක්.

ලිංගික සෞඛ්‍යය ජීවිතය පුරා ම පවතින්නක්. ලිංගික ප්‍රචණ්ඩත්වය, ළමා වියේදී මුහුණ දෙන ලිංගික අපයෝජන, ලිංගිකත්වය පිළිබඳ අසමාන හා නිශේධනාත්මක ප්‍රතිරූප (නිදසුනක් ලෙස ඇතැම් අසභ්‍ය ඡායාරූප/ වීඩියෝ දර්ශන ආදී) මත පදනම් වන ලිංගික තත්ත්වයන් මගින් ආදර හා අඹුසැමි සබඳතා දැඩි සේ පළුදු වී යා හැකියි. ඉන් පුද්ගලයකු මානසික ආතතිය, අයහපත් සෞඛ්‍ය තත්ත්ව, ශාරීරික, මානසික හා ලිංගික ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු විය හැකියි. ඇතැම් විට සිය දිවි හානි කරගැනීම් හෝ මිනීමැරුම් සිදුවීමට පවා ඒවා හේතු විය හැකියි. දූෂණය, ලිංගික/ස්ත්‍රී පුරුෂ සමාජභාවය මුල් කරගත් ප්‍රචණ්ඩත්වය, ලිංගික අඩන්තේට්ටම් හා අනෙකුත් අකටයුතුකම්වලට විරුද්ධ ව විවිධ නීති සෑම රටක ම පවතිනවා. එමෙන් ම වැඩිහිටියන් හා ළමුන් අතර ලිංගික සම්බන්ධතා පැවැත්වීම නීතියෙන් දැඩි දඬුවම් ලැබිය හැකි වරදක්. යමෙකුට ලිංගික සබඳතා පැවැත්වීමට නීතියෙන් අවසර හිමි වන වයස ඒ ඒ රටවලට අනුව වෙනස්.

ශ්‍රී ලංකාවේ පවතින සංස්කෘතික තහංචි, කොන්කිරීම්, ලැජ්ජාවට හා අපකීර්තියට පත්කිරීම් වැනි කරුණු හේතුවෙන් ලිංගිකත්වය පිළිබඳ නිවැරදි තොරතුරු දැනගැනීමටත් ඒ පිළිබඳ සාකච්ඡා කිරීමටත් ඇති නිදහස සීමා වෙනවා. ලිංගික ප්‍රචණ්ඩත්වයක දී බොහෝ විට සිදු වන්නේ එහි වරද ඊට ගොදුරු වූ තැනැත්තා මත පැටවීමත් අපරාධකරු ඉන් ගැලවී යාමත් ය. ලිංගිකත්වය, ලිංගික අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ අවබෝධය නොමැතිකම හා ලිංගිකත්වය පිළිබඳ සාවද්‍ය තොරතුරු පරිහරණය, අසමාන, අයහපත්, ප්‍රචණ්ඩකාරී ලිංගික සම්බන්ධතාවයන්ට ඉඩ සලසන අතර එය නීතිය ඉදිරියේ ද ගැටලු ඇති කරන්නක්.

ලිංගිකත්වය හා ලිංගික සබඳතාවන් කෙරෙහි යහපත් එමෙන්ම ආචාරශීලී පිළිවෙතක් අනුගමනය කිරීමෙන් වඩාත් ආදරණීය, සෞඛ්‍ය සම්පන්න හා එකිනෙකාගෙන් සෑහීමකට පත් විය හැකි සම්බන්ධතාවක් ගොඩ නගා ගත හැකියි. එපමණක් නොව අප සමාජයේ වගකිවයුතු පුද්ගලයින් ලෙස කටයුතු කිරීමට නම් ලිංගික අයිතිවාසිකම්, ලිංගික වගකීම් හා ලිංගික කැමැත්ත යන මූලික සංකල්ප පිළිබඳ අවබෝධයක් අප සතු විය යුතුයි. ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබට තිබෙනවා ද?

# ලිංගික අයිතිවාසිකම් යනු මොනවාද?

- ලිංගික සෞඛ්‍යය පවත්වාගෙන යාමේ අයිතිය
- ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ අයිතිය
- ලිංගික අධ්‍යාපනය හා තොරතුරු දැනගැනීම සඳහා වන අයිතිය
- ලිංගික පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය
- ලිංගික ව ක්‍රියාකාරී වන්නේ ද නැද්ද යන්න පිළිබඳ තීරණය කිරීමේ අයිතිය
- තම සිරුර සම්බන්ධ තීරණ ගැනීමට (ශාරීරික ස්වායත්තභාවය) හා ගරුත්වය ලැබීමට ඇති අයිතිය
- ලිංගික සහකරුවකු තෝරා ගැනීමට ඇති අයිතිය
- එකඟත්වය සහිත ලිංගික සබඳතා පැවැත්වීමට ඇති අයිතිය
- එකඟත්වය සහිත විවාහය සඳහා වන අයිතිය
- ළමුන් බිහි කරන්නේ ද නැද්ද, එසේ කරන්නේනම් කවදා ද යන්න තීරණය කිරීමේ අයිතිය
- තෘප්තිමත්, ආරක්ෂාකාරී, සතුටුදායක ලිංගික ජීවිතයකට ඇති අයිතිය

### ලිංගික අයිතිවාසිකම්

ලිංගික අයිතිවාසිකම් යන්නෙන් අදහස් වන්නේ ජාතික මට්ටමේ නීති මගින් හා ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛන හා අනෙකුත් පොදු සම්මුතීන් මගින් පිළිගත් ලිංගිකත්වය හා සම්බන්ධ මානව අයිතිවාසිකම් ය. ලිංගික අයිතිවාසිකම් ශ්‍රී ලංකා ව්‍යවස්ථාව හා නීති පද්ධතිය මගින් පිළිගෙන තිබෙනවා.

# ඔබගේ ලිංගික අයිතිවාසිකම් හා වගකීම් ඉටු වීමට අවශ්‍ය වන්නේ...

## නිවැරදි තොරතුරු

ලිංගිකත්වය, ලිංගික වර්ධනය හා සංවර්ධනය, තීරණ ගැනීම, ලිංගික නැඹුරුව, උපත් පාලනය, ගර්භණීභාවය පිළිබඳ පවතින අවදානම් හා විකල්පයන්, ප්‍රජනනය හා ඒඩ්ස් වැනි ලිංගික ව සම්ප්‍රේෂණය වන රෝග හා ආරක්ෂාකාරී ලිංගික හැසිරීම් පිළිවෙත් පිළිබඳ නිවැරදි තොරතුරු දැන ගැනීමට ඔබට අයිතියක් තිබෙනවා.

ඉහත සඳහන් දෑ සම්බන්ධයෙන් දැනුවත් වීමේ වගකීමත් එම තොරතුරු උපයෝගී කර ගනිමින් ඔබගේ ලිංගික ජීවිතය පිළිබඳ යෝග්‍ය හා වගකීම් සහගත තීරණයන්ට එළඹීමේ වගකීමත් ඔබ සතුයි.

### දැනුවත්වීම වැදගත්


ලිංගික ක්‍රියාකාරකමක් සඳහා සිය එකඟත්වය පළ කරන විට තමුන් එකඟත්වය පළකරන්නේ කුමන කටයුත්තක් සඳහා ද යන්නත් ඉන් ඇති වන ප්‍රතිඵල පිළිබඳවත් මනා දැනුමක් එම පුද්ගලයා සතු විය යුතුයි.

## ලිංගික කටයුතු සඳහා ඔබගේ අනුමැතිය

අනුමැතිය ලබා දීමට ඔබට අයිතියක් ඇත.
ප්‍රතික්ෂේප කිරීමට ද ඔබට අයිතියක් ඇත.
එමෙන්ම;
ඔබ කෙතරම් දුරට එහි නියැළී සිටිය ද ඔබ තව දුරටත් ඊට අකැමැති නම්;
ඔබ අතීතයේ දී ලිංගික ක්‍රියාවකට එකඟ වී සිටිය ද තව දුරටත් ඊට අකැමැති නම්;
අනෙක් තැනැත්තා තව දුරටත් එම කටයුත්තෙහි නිරත වීමට කැමැත්ත දැක්වූව ද ඔබ ඊට අකැමති නම්;
අනෙක් තැනැත්තා ඔබ 'හැඟීම් අවුස්සන සුළු' ලෙස සිතුව ද ඔබ ඊට අකැමති නම්;
ඊට එකඟ නොවීමට හා ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇත.

### අනුමැතිය පළ කිරීමේ ක්‍රියාවලිය

ලිංගික ක්‍රියාකාරකමක් සඳහා අනුමැතිය පළ කිරීම යන්නෙන් අදහස් වන්නේ හුදෙක් අනෙක් පුද්ගලයාට අවශ්‍ය දේ සිදු කිරීමට ඉඩ හැරීමක් හෝ අනෙකාගේ ඉල්ලීමට යටත් වීමක් හෝ නොවන අතර දෙදෙනාගේ ම ක්‍රියාකාරී එකඟත්වයකි.




### ඔබ දන්නවා ද?

- ඕනෑම ආකාරයක ලිංගික කටයුත්තකට අනුමැතිය ලබා ගැනීම අවශ්‍යයි.
- විවාහය තුළ දී හෝ ආදර සම්බන්ධතාවයක දී යම් ලිංගික කටයුත්තක නියැළීමට නම් ඊට ඔබගේ අනුමැතිය පැවතිය යුතුයි.
- පෙර එකඟත්වය පළ කර සිටියත් අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී එය ප්‍රතික්ෂේප කිරීමට ඔබට හැකියි.
- ගැහැණු ළමයෙකුගේ /ගැහැණියකගේ අනුමැතියකින් තොරව ලිංගික සංසර්ගයේ යෙදීම සාපරාධී ක්‍රියාවක්. දූෂණය කිරීමෙන් හෝ එසේ කිරීමට තැත්කිරීමෙන් ඔබට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගයන්ට එළඹෙන්නට පුළුවන්.
- මුකුළු කිරීම්/කෙනෙකුගේ හැඟීම් අවුස්සන සුළු චර්යා/ ශරීරය නිරාවරණය වන ඇඳුම් ආදිය අනුමැතිය පළ කිරීමක් ලෙස සැලකිය නොහැකියි.
- සම්බන්ධතාවකදී මුදල් හෝ තෑගි පිළිගැනීම ලිංගික ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය ලබා දීමක් ලෙස සැලකිය නොහැකියි.
- දෙමාපියන්ට/භාරකරුට/ළඟම ලේ ඥාතියාට එම තැනැත්තා වෙනුවෙන් ලිංගික ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය දිය නොහැකියි.
- යමෙකුට තර්ජනය කර ලිංගික ක්‍රියාකාරකමක් සඳහා ලබා ගන්නා අනුමැතිය අනුමැතිය ලබා ගැනීමක් ලෙස නොසලකයි.
- ඉරියව් හෝ අංග චලන මගින් පමණක් දැනවෙන අදහස් අනුමැතිය ලබා දීමක් ලෙස සැලකිය නොහැකියි.